# ප්‍රගති වාර්තාව

# 1994

පරිසර අංශය

ප්‍රවාහන, පරිසර හා වනිතා කටයුතු අමාත්‍යාංශය

6 වැනි මහල - යුනිටි ප්ලාසා ගොඩනැගිල්ල - කොළඹ 04

## පටුන


පිටුව

**සාමාන්‍ය කටයුතු** 01 - 13

පරිසර කටයුතු විමධ්‍යගත කිරීම

21 වැනි සියවසේ න්‍යාය පත්‍රය

දකුණු ආසියාතික සහයෝගිතා පරිසර වැඩ සටහන

ආදිවාසික ජනතාව පිළිබඳ වැඩ සටහන

පරිසර ප්‍රවර්ධන හා ප්‍රචාරක කටයුතු

**ස්වභාවික සම්පත්, භූමි පරිහරණය සහ භෞතික ගැටලු** 14 - 20

ජෛව විවිධත්වය

මොන්ට්‍රියෙල් සන්ධානය

දේශගුණ විපර්යාස පිළිබඳ සම්මුතිය.

පවිත්‍ර වාතය - 2000 ක්‍රියාත්මක සැලැස්ම

පරිසර නීතිය පිළිබඳ කටයුතු

**අනුග්‍රාහක ව්‍යාපෘති** 21 - 31

නොරාඩ් පාරිසරික සහයෝගිතා වැඩ සටහන

ස්වභාවික සම්පත් හා පාරිසරික ප්‍රතිපත්ති ව්‍යාපෘතිය

## පරිසර කටයුතු විමධ්‍යගත කිරීමේ වැඩ සටහන

පරිසර කටයුතු ප්‍රාදේශීය මට්ටම දක්වා ගෙනයාම අරමුණු කරගෙන, විමධ්‍යගත කිරීමේ වැඩ පිළිවෙලක් 1994.01.01 වන දින සිට ක්‍රියාවට නංවන ලදි.

මෙම විමධ්‍යගත කිරීමේ වැඩ සටහන යටතේ 1994 වර්ෂය තුළදී පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදි.

- පරිසර දූෂණය පාලනය කිරීම සහ කුඩා පරිමාණයේ **දූෂ්‍යකාරක** කර්මාන්ත සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව බලතල හා කාර්යයන් ජාතික පාරිසරික පනත යටතේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් පළාත්පාලන ආයතනවලට පැවරීම.
- එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයක් තුළ පරිසරයට හා සංවර්ධනයට අදාළ සියළුම කරුණු සම්බන්ධීකරණය කිරීමත්, මෙහෙයවීමත් සඳහා ප්‍රාදේශීය ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ප්‍රාදේශීය පාරිසරික මෙහෙයුම් කමිටු පිහිටුවීම.
- විමධ්‍යගත කරනු ලැබූ පාරිසරික කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන මූලික දැනුම ලබාදීමට පළාත්පාලන ආයතනවලට අනුයුක්ත කාර්මික කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැඩ පිළිවෙලක් දියත් කරන ලදි. මධ්‍යම පරිසර අධිකාරියේ සහාය ඇතිව මෙම පුහුණු පාඨමාලා දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලැබීය.
- විමධ්‍යගත වැඩ පිළිවෙල පැහැදිලි කරදීම සඳහා සෑම පළාතකම පළාත් පාලන ආයතනවල සභාපතිවරුන් සහ ඡන්දයෙන් තේරී පත්වූ නියෝජිතයින් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදි.
- සෑම පළාත්පාලන ආයතනයකම, අඩු වශයෙන් එක් අයෙකු බැගින් වනසේ, පළාත්පාලන ආයතන බල ප්‍රදේශයේ පරිසර කටයුතු ක්‍රියාත්මක කිරීමට සහාය කර ගැනීම පිණිස උපාධිධාරී අභ්‍යාසලාභීන් පළාත්පාලන ආයතනවලට අනුයුක්ත කරන ලදි.

- පරිසර කටයුතු පිළිබඳ විමධ්‍යගත වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශ වශයෙන් පාරිසරික අත්පොත් පිළියෙළ කර, පළාත් පාලනය ආයතනවලටත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලටත් ලබාදෙන ලදී.

- පරිසර රක්ෂණයට අදාළ නීතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම සහ මෙහෙයවීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් සෑම දිස්ත්‍රික්කයකම දිස්ත්‍රික් නීති ක්‍රියාත්මක කිරීමේ කමිටුවක් බැගින් පිහිටුවා ඇත.

## 21 වැනි සියවසේ න්‍යාය පත්‍රය:

21 වැනි සියවසේ න්‍යාය පත්‍රයෙහි එනම් 1992 ජුනි මස රියෝද ජැනෙයිරෝ නුවර පැවැත්වූ පරිසරය සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවේ වාර්තාවෙහි වර්තමානයේ පවත්නා ගැටළු පමණක් නොව ඊළඟ ශත වර්ෂයේදී ලෝකයට මුහුණපෑත්තට සිදුවන අභියෝග පිළිබඳව ද ඇතුළත් කර ඇත. එම වාර්තාවෙහි,සංවර්ධනය සහ පාරිසරික සහයෝගිතාව පිළිබඳව ඉහළින්ම සඳහන් කර ඇත. දුප්පත්කම දුරලීම, පරිභෝජන රටාව වෙනස් කිරීම,තාක්ෂණය පවරාදීම ආදී රජයේ කුඩා මහත් සියලු කටයුතු සම්බන්ධ කරණු මෙම න්‍යාය පත්‍රයට ඇතුළත්ව ඇත.

මෙම 21 වැනි සියවසේ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම පිළිබඳව ජාත්‍යන්තර වශයෙන් ඇති බැඳීම නිසා සංවර්ධනය වන රටවලට ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික සංවිධාන මාර්ගයෙන් සම්පත් ගලා ඒමක් බලාපොරොත්තු විය හැකිය.

21 වැනි න්‍යාය පත්‍රය සාර්ථකව ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙත පැවරී ඇත. මේ නිසා සංවර්ධනය වන රටවල හැකියාවන් දියුණු හා ශක්තිමත් කිරීම සඳහා වැඩ පිළිවෙලක් ආරම්භ කර ඇත. මේ යටතේ ජගත් න්‍යාය පත්‍රයට අනුව ජාතික න්‍යාය පත්‍රය සකස් කිරීමට සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රවාහන,පරිසර හා වනිතා කටයුතු අමාත්‍යාංශයේ පරිසර අංශය තුළ වෙනමම කාර්යාංශයක් පිහිටුවීමට ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන කාර්යාලය සමඟ දැනටමත් කටයුතු ආරම්භ කර ඇත.

## දකුණු ආසියාතික සහයෝගිතා පරිසර වැඩ සටහන(සකෙප්):

මෙම ආයතනය 1981 දී "කොළඹ ප්‍රකාශනය" යටතේ කොළඹ පිහිටුවන ලදි. මෙය සාමාජික රටවල් 9 ක් අයත් වේ. මෙය සාක් සංවිධානයට බොහෝ කලකට පෙර පාරිසරික සහයෝගීතත්වය සඳහා ඇති කරන ලද්දකි. මෙම ආයතනය සඳහා පසු අවුරුදු වැඩ සටහනක්(1992/96) සකස් කර ඇති අතර, ඒ අනුව පහත දැක්වෙන පරිදි පාරිසරික ව්‍යාපෘති ගණනාවක්ම දියත් කර ඇත.

## I. **පාරිසරික තත්ත්ව පිළිබඳ වාර්තාව:**

පළමු වරට සකෙප් ආයතනයේ ආධාර හා උපදෙස් අනුව මෙම අමාත්‍යාංශයේ පරිසර අංශය විසින් ලංකාවේ පාරිසරික තත්ත්වය පිළිබඳ වාර්තාවක් සකස් කරන ලදි. සකෙප් සාමාජික රටවල මෙබඳු ජාතික වාර්තා එකට එකතු කර සකෙප් ආයතනය විසින් පත් කරන ලද උපදේශකවරයෙකු විසින් දකුණු ආසියාතික කලාපය සඳහා පාරිසරික තත්ත්වය දැක්වෙන පොදු වාර්තාවක් සකස් කරනු ඇත.

මේ පිළිබඳව 1994 ඔක්තෝම්බර් මාසයේ කොළඹ දී පැවැත්වුණු වැඩ මුළුවේදී එම කෘතියට ඇතුළත් වියයුතු අංගෝපාංග ගැන සාකච්ඡා කර නිගමනයට එළඹුණ අතර, කලාපීය වාර්තාව 1995 වර්ෂයේ මුල් භාගයේදී සකස් වනු ඇත.

## II. **දකුණු ආසියාතික කලාපීය සාගර පිළිබඳ වැඩ සටහන:**

මේ පිළිබඳ යෝජනාව බොහෝ කලකට පෙර ඉදිරිපත් කරන ලද්දක් වුවද 1993 වසර තෙක් එය ක්‍රියාවට නැඟුනේ නැත. සකෙප් ආයතනය එක්සත් ජාතීන්ගේ පරිසර වැඩ සටහනේ ආධාර සහ උපදෙස් අනුව ක්‍රියාවට නන්වන ලද අතර, මේ පිළිබඳව වැඩ සටහන් අනුමත කිරීමේ අමාත්‍ය මට්ටමේ රැස්වීමක් 1995 මාර්තු මස නවදිල්ලියේ පැවැත්වෙනු ඇත. මෙය කලාපීය සාගර පිළිබඳ 13 වැනි ව්‍යාපෘතිය වේ.

## III. **පරිසරය පිළිබඳ ළමා පොත්:**

සකෙප් ආයතනයෙන් ආරම්භ කරන ලද තවත් ව්‍යාපෘතියකි මෙය. වයස 8- 16 දක්වා ළමයින් සඳහා සකෙප් ආයතනය විසින් දෙන ලද විෂයයන් යටතේ පොත් ලිවීම සඳහා සාමාජික රටවල්වලට දැනුම් දෙන ලදි. එසේ ලියන ලද පොත් සකෙප් ආයතනය විසින් මුද්‍රණය කරවා එක් සාමාජික රටකට පිටපත් 300 බැගින් සපයන ලදි. යම්කිසි සාමාජික රටකට අමතර පිටපත් අවශ්‍ය වේ නම් මේ සඳහා මුද්‍රණ අයිතිය පවරාදීමට සකෙප් ආයතනය කැමැත්තෙන් සිටී. මෙම ව්‍යාපෘතියේ ඊළඟ පියවර වන්නේ මෙම ළමා පොත්

සාමාජික රටවල භාවිතා වන එක් භාෂාවකට පරිවර්තනය කිරීම සඳහා ආධාර දීමයි.

### IV. සකෙප් ප්‍රවෘත්ති ප්‍රකාශනය:

සකෙප් ආයතනය සෑම කාර්තුවකම ප්‍රවෘත්ති ප්‍රකාශන නිකුත් කරයි. එහි 19 වැනි කලාපය තව නොබෝ දිනකින් බිහිවනු ඇත.

### V. සකෙප් පාරිසරික ස්වභාවික සම්පත් පිළිබඳ තොරතුරු ව්‍යාපෘතිය(සෙන්රික් ව්‍යාපෘතිය):

එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩ සටහන යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. පරිසරය සහ සංවර්ධනය එක්තැන් කිරීමෙන් ධරණීය සංවර්ධනය ගොඩ නගා ගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය ඉවහල් වේ. මෙමගින් ජාතික පාරිසරික තොරතුරු පද්ධතියක් ස්ථාපනය කර ජාලමය සම්බන්ධීකරණයක් ඇති කිරීම සිදු කෙරේ. මේ වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩ සටහන යටතේ සකෙප් ප්‍රධාන කාර්යාලයේ සේවය කරන විශේෂඥයෙක් වසරකට පත්කර ඇත. එමෙන් ම මේ සඳහා අවශ්‍ය උපකරණ ද එම ආයතනය විසින් සපයා ඇත. එමෙන් ම තොරතුරු රැස් කිරීම හා සැලසුම් කිරීම සඳහා මෙය ඉතාම ප්‍රයෝජනවත් ව්‍යාපෘතියකි. එමගින් භූගෝලීය තොරතුරු පද්ධතියක් සැපයිය හැකි වේ. එබඳු තොරතුරු පද්ධතියක් මධ්‍යම පරිසර අධිකාරියේ ද නොබෝ දිනකින් පිහිටුවනු ඇත.

### VI. සකෙප්/නෝරාඩ් සහයෝගීතාව:

නුදුරු අනාගතයේදී ක්‍රියාත්මක කෙරෙන තවත් ව්‍යාපෘති දෙකක් සඳහා නෝරාඩ් ආයතනය සමඟ සකෙප් කාර්යාලය ගිවිසුම් අත්සන් කර ඇත. මේ යටතේ දකුණු ආසියාතික රටවල සත්ව ජෛව විවිධත්වය හා පාරිසරික පුහුණුව සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කර ඇත. මෙමගින් මෙම කලාපීය රටවල්වලට විශේෂ වාසි සැලසෙන අතර, සාමාජික රටවල් වෙනුවෙන් ද්විපාර්ශ්වික හා ජාත්‍යන්තර ආයතනවලින් විදේශ ආධාර ලබාගැනීම ද සිදු කෙරෙනු ඇත.

### VII. සයවැනි පාලන සභා රැස්වීම:

සකෙප් ආයතනයේ ව්‍යවස්ථා සංග්‍රහය අනුව දෙවසරකට වරක් පාලන රැස්වීමක් පැවැත්විය යුතුය. මෙය අමාත්‍ය මට්ටමේ රැස්වීමක් වන අතර,

අකාරාදී පිළිවෙලට මෙම රැස්වීම පැවැත්වෙන රට තීරණය වේ. මේ අනුව සයවැනි පාලන සභා රැස්වීම 1994 අගෝස්තු මාසයේ පාකිස්තානයේ ඉස්ලාමාබාද් නුවර පැවැත් විනි. ප්‍රතිපත්තිමය තීරණයන් ගැනීම සහ මීළඟ දෙවසර තුළ ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති ද ඒ සඳහා අයවැය අනුමත කිරීම ද මෙම පාලන සභාව මඟින් කරනු ලැබේ.

---

## 3. ආදිවාසික ජනතාව පිළිබඳ වැඩ සටහන.

එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනය විසින් 1993, ලෝක ආදි වාසික ජනතාව පිළිබඳ ජාත්‍යන්තර වර්ෂයක් වශයෙන් නම්කිරීමත් සමග ශ්‍රී ලංකාවේද ආදි වාසික ජනතාව පිළිබඳ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇතිව ජාතික කමිටුවක් පත් කරන ලදී. පරිසරය හා සංවර්ධනය සඳහා එක්සත් ජාතීන්ගේ සමුළු වාර්තාවේද ආදි වාසික ජනතාවගේ කාර්ය භාරය ශක්තිමත් කිරීම පිළිගෙන ඇත. මේ අනුව අප රටද ආදි වාසික ජනතාව පිළිබඳ මහත් අභිලාසයකින් යුතු වැඩ සටහන් දියත් කරන ලදී. දැනට ක්‍රියාත්මක කරන ලද එබඳු වැඩ සටහන් සමහරක් පහත සඳහන් වේ.

I . ආදි වාසිකයන් පිළිබඳ ජාත්‍යන්තර වර්ෂය වෙනුවෙන් සමරු මුද්දර 2 ක් 1994 සැප්තැම්බර් මස නිකුත් කිරීම.

II . සියලුම ජන මාධ්‍ය මගින් ආදි වාසික ජනතාවගේ ජන ජීවිතය පිළිබඳ පුළුල් ප්‍රචාරයක් දීම.

III . මෙම විෂය/ සඳහා ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය විශේෂ සැසි වාරයක් පැවැත් වීම.

Iv . මැලේසියාවේ පැවැත් වුණු ජාත්‍යන්තර රැස්වීමට ශ්‍රී ලංකාව සහභාගි වීම.

v . මෙම අමාත්‍යාංශයේ පාරිසරික ප්‍රකාශනය වන 'සොබා' සඟරාවේ විශේෂ කලාප දෙකක් මෙම තේමාව යටතේ නිකුත් කිරීම. (1993 අවසන් ප්‍රකාශනය හා 1994 ප්‍රථම ප්‍රකාශනය)

vI . ආදි වාසික ජනතාව පිළිබඳ නොයෙක් ආයතනවල ඇති වීඩියෝ සහ චිත්‍රපට ඡායාපට පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම.

vII. වැදි ජනතාව පිළිබඳ රචිත ලියවිලි, සාහිත්‍ය ග්‍රන්ථ ආදිය පිළිබඳව නාමාවලියක් සකස් කිරීම.

vIII. නැගෙනහිර පළාතේ වෙසෙන වෙරළ ආශ්‍රිත වැදි ජනතාව පිළිබඳ පර්යේෂණයක් මඩකලපුව නැගෙනහිර විශ්ව විද්‍යාලය මගින් ආරම්භ කිරීම.

Ix . ආදි වාසික ජනතාව පිළිබඳ ආකෘති, අනුරූප ආදිය ඇතුලත් විශේෂ අංශයක් ජාතික කෞතුකාගාරයේ පිහිටුවීමට සැලසුම් කිරීම.

* ආදිවාසික ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 169 වැනි සම්මුතිය පිළිගැනීම පිළිබඳ ශක්‍යතාවය අධ්‍යයනය කිරීම.

මේ අනුව රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය හා රාජ්‍ය නොවන සංවිධානවල සහයෝගීත්වය ඇතිව පසුගිය වර්ෂය තුළ මේ පිළිබඳව සෑහෙන වැඩ කොටසක් ඉටු කර ඇත. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1994 දෙසැම්බර් මස ආදි වාසිකයන් පිළිබඳ දශකයන් වශයෙන් මීළඟ අවුරුදු 10 නම් කිරීම නිසා දැනට පිහිටුවා ඇති ජාතික කමිටුව ආදි වාසිකයන් පිළිබඳ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ස්ථාවර කමිටුවක් බවට පත් කිරීමට රජයේ අනුමැතිය ලබාගැනීම සඳහා කටයුතු කරගෙන යනු ලැබේ.

---

## පරිසර ප්‍රවර්ධන හා ප්‍රචාරක කටයුතු

පරිසර සංරක්ෂණයේදී හා සංවර්ධනයේදී සැලසුම් ගත ප්‍රවර්ධන හා ප්‍රචාරාත්මක වැඩ සටහනක් තිබීම අත්‍යාවශ්‍ය වේ. නවතම පරිසර විද්‍යාත්මක හා සංස්කෘතික දැනුම් සම්භාරය ක්ෂණිකවත්, කාර්යක්ෂමවත් මහජනතාව වෙත සන්නිවේදනය කිරීම මෙහිලා වැදගත් වේ.

පරිසරික ගැටලු හා පරිසර සම්පත් හඳුනා ගැනීමට ජනතාව යොමු කිරීම මෙම සන්නිවේදන ක්‍රියාවලියේ මූලික අරමුණක් වේ.

සමාලෝචිත වර්ෂය තුළදී ජන සන්නිවේදන මාධ්‍යයන් වශයෙන් ගැනෙන රූපවාහිනිය හා ගුවන් විදුලිය වැනි විද්‍යුත් සන්නිවේදන මාධ්‍ය මෙන්ම පුවත්පත් සඟරා ආදි මුද්‍රිත මාධ්‍යයන්ද, පාරම්පරික සන්නිවේදන විධි හා පුද්ගලාන්තර සන්නිවේදන ක්‍රමෝපායයන් ද මෙම කාර්යය සඳහා කාර්යක්ෂම ලෙස උපයෝගී කරගන්නා ලදි.

පරිසර ප්‍රවර්ධන කටයුතු පිළිබඳව ජනාවබෝධය දියුණු කිරීමට මෙන්ම එහිලා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලට කිසියම් මඟ පෙන්වීමක් කිරීම සඳහා ද නියමු ව්‍යාපෘති කිහිපයක් සමාලෝචිත වර්ෂය තුළ සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි.

ජෛව විවිධත්වය, මොන්ට්‍රියෙල් සන්ධානය ක්‍රියාත්මක කිරීම, දේශගුණික විපර්යාසය පිළිබඳ සම්මුතිය, පිරිසිදු වාතය, 2000 ක්‍රියාත්මක සැලැස්ම, උපද්‍රවකාරී ද්‍රව්‍ය පිළිබඳ බේසල් සම්මුතිය වැනි ජාත්‍යන්තර සම්මුති එකිනෙක පිළිබඳව ජනාවබෝධය වර්ධනය කිරීමේ වැඩ පිළිවෙලක් ද මේ වර්ෂයේදී ආරම්භ කරන ලදි.

ජෛව විවිධත්වය පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීමේ විශේෂ ප්‍රවර්ධන හා ප්‍රචාරාත්මක වැඩ පිළිවෙලක් මේ යටතේ සැලසුම් කර දියත් කරන ලදි. ඒ අනුව කොළඹ සිට මහනුවර දක්වා දුම්රිය මාර්ගයේ හමුවන පරිසර පද්ධති හා ජෛව විවිධත්වය පිළිබඳව පාසල් සිසුන් තුළ ප්‍රායෝගික දැනුම වර්ධනය කිරීමට පරිසර ගාමී දුම්රියක් උපයෝගී කර ගන්නා ලද අතර, එම වැඩ පිළිවෙලට කොළඹ, රඹුක්කන හා මහනුවර වැනි ප්‍රදේශවල පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 1000 ක් පමණ සම්බන්ධ කරගන්නා ලදි.

2. මහමෙවුනා උයනේ රුක්රෝපණ ව්‍යාපෘතිය:

ප්‍රවාහන, පරිසර හා වනිතා කටයුතු අමාත්‍යාංශය , පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේත්, උතුරු මැද පලාත් සභාවේ හා අනුරාධපුර නගර සභාවේත් අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ප්‍රධාන රජයේ හා රජයේ නොවන ආයතනවලත්

සහාය ඇතිව අනුරාධපුරයේ මහමෙව්නා උයනේ රුක්රෝපණ ව්‍යාපෘතියක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට විධිවිධාන යොදා ඇත.

උතුරින් ථූපාරාම චෛත්‍යයත්, දකුණින් දක්ඛින ථූපයත්, නැගෙනහිරින් හාල්පැන් ඇලත්, බටහිරින් බසවක්කුලම වැව හා මිරිසවැටිය චෛත්‍යයත් මායිම් වූ මහමෙව්නා උයන අක්කර 750 ක් පමණ භූමි භාගයකින් යුක්ත වේ. මහමෙව්නා උයනේ රුක්රෝපණ කටයුතු අදියර 5 කින් නිම කිරීමට අපේක්ෂා කෙරේ. එක් අදියරකට අක්කර 150 බැගින් අදියර පහකට අක්කර 750 ක් සම්පූර්ණ වන පරිද්දෙනි.

විවිධ හේතූන් නිසා කාලයක් තිස්සේ මහමෙව්නා උයනේ තුරුලතා විනාශ වෙමින් පවතින අතර, දැනට එහි සමහර කොටස්වල තුරුලතා ඇත්තේම නැත. වයස්ගත වීමත්, නිදැල්ලේ හැසිරෙන ගවයන් හා වඳුරන් වැනි සතුන්ගෙන් පැමිණෙන හානි හා වන්දනා කාලවල වන්දනාකරුවන් ගස් අතර ගිනි මෙලැව්වීම වැනි කරුණු නිසා මෙසේ එහි තුරුලතා ගහනය ඉතා ශූන්‍යව ඇති බව පිළිගැනේ.

අරළු, බුළු, නෙල්ලි, සඳුන්, ඇහැල වැනි සුවිශේෂ වටිනාකමක් ඇති ගස්වැල් රෝපණය කිරීමට අපේක්ෂිතය.

අලුතෙන් රෝපණය කරනු ලබන පැල වසර පහක් පමණ වනතුරු නඩත්තු කිරීමට බලාපොරොත්තු වේ. මෙම කාර්යය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ.

අතීතයේදී තුරුලතාවන්ගෙන් අලංකාරව පැවැති අනුරාධපුර පූජා නගරයේ ඓතිහාසික මහමෙව්නා උයන පුනරුත්ථාපනය කිරීමේ මෙම ජාතික කාර්යයට රජයේ හා රජයේ නොවන ආයතනවල ද, මහජනතාවගේද පූර්ණ අනුග්‍රහය ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

මේ සඳහා කැපකරු ක්‍රමයක් හඳුන්වාදීමට දැනටමත් සැලසුම් කර ඇත. ඒ අනුව ඕනෑම ආයතනයකට හෝ පුද්ගලයකුට ගසකට රුපියල් 1000/=බැගින් වැය දැරීමෙන් ගසක හෝ ගස් කිහිපයක කැපකරුවකුවීමට අවස්ථාව සැලසේ. අදාළ මුදල් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 'මහමෙව්නා උයනේ රුක්රෝපණ පිළිබඳ අරමුදලට ' බැර කිරීමෙන් අනතුරුව නියමිත ගස හෝ ගස් ප්‍රමාණය එම ආයතනයේ හෝ පුද්ගලයාගේ නමින්(කුඩා දැන්වීම් පුවරුවක් යොදා) සිටුවා නඩත්තු කරනු ලැබේ.

මෙම වැඩ පිළිවෙල යටතේ දැනට රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන ගණනාවක්ද, පොදු ජනතාව සෑහෙන සංඛ්‍යාවක් ද පැළ රෝපණයට දායකවී සිටී.

3. **තුරුලතා බැංකු:**

පාසල් ළමුන්ගේ පාරිසරික අවබෝධය වර්ධනය කරලීමත්, ඔවුන් මුදල් ඉතිරි කිරීම කෙරේ යොමු කිරීමත් අරමුණු කරගත් තුරුලතා බැංකු ක්‍රමය නියමු ව්‍යාපෘතියක් වශයෙන් මහනුවර පාසල් තුනක ආරම්භ කරන ලදි. කිරිබත්කුඹුර, ශ්‍රී ස්වර්ණජෝති මහා විද්‍යාලය, වත්තේගම බාලිකා මහා විද්‍යාලය හා වත්තේගම මධ්‍ය මහා විද්‍යාලය යන පාසල් තුනේ ආරම්භ කළ මෙම තුරුලතා බැංකු නියමු ව්‍යාපෘති වශයෙන් ක්‍රියාත්මක කෙරුණි.

4. **පරිසර ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය:**

1992 වසරේ නියමු ව්‍යාපෘතියක් ලෙසින් ආරම්භ කළ පරිසර ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය මේ වසරේදී තවදුරටත් පුළුල් කෙරිනි.

**අරමුණු:**

1. ග්‍රාමීය සංවර්ධනයේදී පා රිසරික සංවර්ධනය පිළිබඳව වඩාත් අවධියෙන් සිටීමට ජනතාව දැනුවත් කිරීම.
2. ග්‍රාමීය ජනතාවගේ පාරිසරික අවබෝධය හා අවධානය වර්ධනය කිරීම.
3. සෑම ගම්වැසියකුටම පරිසර නිරීක්ෂකයකු බවට පත්වීමට අවස්ථාව සැලසීම.
4. පරිසරය සුරකින අතරම අතිරේක ආදායම් ලබා ගැනීමේ ව්‍යාපෘති හා ස්වයං රැකියා හඳුන්වාදීම. (උද්‍යාන විද්‍යාව, කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය, වන වගා, අපද්‍රව්‍ය ප්‍රතිභාවිතය හා කඩදාසි නිෂ්පාදනය..)
5. ස්වාභාවික සම්පත් පරිහරණය සහ කළමනාකරණය මෙන්ම පරිසර සංරක්ෂණය සඳහා ද පාසල් සිසුන් යොමු කරවා ගැනීම.
6. පාසල් සිසුන් ඉතිරි කිරීමට හා පරිසර සංරක්ෂණයට යොමු කෙරෙන තුරුලතා බැංකු හඳුන්වාදීම.

පරිසර සංරක්ෂණයේදී හා ස්වාභාවික සම්පත් කළමනාකරණයේදී ග්‍රාමීය ජනතාව ක්‍රියාකාරී ලෙස සහභාගි කරවා ගැනීම මෙම වැඩ සටහනේ මූලික අරමුණයි. එහිලා ග්‍රාමීය සංවර්ධනයේදී පාරිසරික සංවර්ධනය කෙරෙහි අවධියෙන් සිටීමට ජනතාව දැනුවත් කිරීමත්, පරිසරය සුරකින අතරම අතිරේක ආදායම් මාර්ග උපයා ගැනීමට මං සැලසෙන ස්වයං රැකියා ව්‍යාපෘති හඳුන්වා දීමත්, පාසල් සිසුන් පාරිසරික කටයුතු කෙරේ නැඹුරු කරවීම හා පොදුවේ ගම් මට්ටමින් ප්‍රවර්තනීය සංවර්ධන ක්‍රියා දාමයකට ඉඩ සැලසීමත් උදෙසා විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරෙනු ලැබ ඇත.

මේ හැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ආදර්ශ ගම්මාන වැඩ පිළිවෙල පුළුල් කිරීමටද විධිවිධාන යොදා ගෙන යනු ලැබේ.

5. <u>පරිසර ප්‍රකාශන:</u>

මෙම අමාත්‍යාංශයේ පරිසර ප්‍රකාශනය වන 'සොබා) සඟරාව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම නොකඩවා ප්‍රකාශයට පත් කරන ලදි.

ජෛව විවිධත්වය පිළිබඳ ජනාවබෝධය වර්ධනය කරලීම සඳහා විශේෂ සොබා කලාපයක් මුද්‍රණය ක ප්‍රකාශයට පත් කරන ලදි. ඊට අමතරව ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය පිළිබඳ ක්‍රියාත්මක සැලැස්මක් සක් කිරීමේ ක්‍රමෝපායයන් පිළිබඳ වාර්තාව මුද්‍රණය කර ප්‍රකාශයට පත් කර ඇත.

තවද, කොළඹ සිට බදුල්ල දක්වා වන දුම්රිය මාර්ගය ආශ්‍රය කර ගනිමින් විවිධ වූ පාරිසරික පද්ධතීන් හා පරිසර ගැටළු පිළිබඳ කරුණු පැහැදිලි කෙරෙන නව ආරක ග්‍රන්ථයක් 'උඩරට මැණිකේ පරිසර චාරිකාව' නමින් මුද්‍රණය කර ප්‍රකාශයට පත් කරන ලදි.

ප්‍රාදේශීය සභා, නගර සභා හා මහනගර සභා යන පළාත්පාලන ආයතනවල පරිසර කටයුතුවලදී උපයෝගී කරගත හැකිවන පරිදි පරසර අත්පොතක් භාෂා තුනෙන්ම මුද්‍රණය කර බෙදා හරින ලදි. ඒ ඒ පළාත්පාලන ආයතන සතු පරිසර බලතල හා නීතිරීති පිළිබඳ පැහැදිලි කිරීමක් ද මෙම අත්පොත මඟින් සිදු කෙරිණි.

6. <u>රූපවාහිනී වැඩ සටහන්:</u>

රූපවාහිනී සංස්ථාව සමඟ සම සහයෝගයෙන් සකස් කරගත් පරිසර අධ්‍යාපනික වැඩ සටහන් රාශියක්ම මේ වසරේ සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි.

ආදිවාසීන් පිළිබඳ ජාත්‍යන්තර ක්‍රියාවලියට සමගාමීව ඔවුන් පිළිබඳ තොරතුරු එළි දැක්වීම සඳහා සජීවී රූපවාහිනී වැඩ සටහනක් දඹානේ සිට විසුරුවා හැ රීම විශේෂ සිද්ධියක් වේ.

මීට අමතරව, ලෝක පරිසර දිනය, ජාතික රුක්රෝපණ දිනය වැනි කාලීන වශයෙන් වැදගත් වන විවිධ විෂයයන් අළලා රූපවාහිනී වැඩ සටහන් ගණනාවක්ම අමාත්‍යාංශයේ අනුග්‍රහය යටතේ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව විසින් නිෂ්පාදනය කර විසිරණය කරන ලදි.

## ගුවන් විදුලි වැඩ සටහන්:

කාලීන වැදගත්කමක් ඇති පාරිසරික විෂයයන් යටතේ ගුවන් විදුලි වැඩ සටහන් කිහිපයක්ම නිෂ්පාදනය කර විසිරණය කරන ලදි. ගුවන් විදුලි සංස්ථාවේ පූර්ණ සහාය මේ සඳහා ලැබිණ. මහමෙව්නා උයනේ රුක්රෝපණ ව්‍යාපෘතිය, රුක්රෝපණය දින වැඩ සටහන් සහ ඖෂධ උයන් හා සිංහරාජය පිළිබඳ වැඩ සටහන් ඒ අතර විශේෂ වේ.

ප්‍රජා ගුවන් විදුලි සේවාවන්ගේ සහාය ලබා විසිරණය කළ වැඩ සටහන් ද රාශියකි. කොළඹ සිට මහනුවර දක්වා වූ පරිසර ගාමී දුම්රිය චාරිකාව, මහමෙව්නා උයනේ රුක්රෝපණ වැඩ සටහන වැනි වැඩ සටහන් කිහිපයක්ම මේ යටතේ ප්‍රචාරය විය.

## ජෛව විවිධත්ව ඒකකය:

### අරමුණු:

- ජාතික ජෛව විවිධත්ව ක්‍රියාත්මක සැලැස්ම සම්පාදනය.
- ක්‍රියාත්මක වෙමින් පවත්නා ජෛව විවිධත්ව කාර්යයන් සඳහා අන්තර් ආයතන සම්බන්ධීකරණය.
- 'තරෙප්' ව්‍යාපෘතියේ ජෛව විවිධත්ව කාර්යයන් සඳහා කාර්ය සැලසුම් සැකසීම හා ඒ වා ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම.
- ජෛව විවිධත්වය පිළිබඳ ජාතික විශේෂඥ කමිටුව පිළිබඳ සම්බන්ධීකරණය.

### ජෛව විවිධත්වය:

1.1 ජීව විවිධත්වය සංරක්ෂණය පිළිබඳ සමායෝජක කණ්ඩායම මඟින් ජාතික ජෛව විවිධත්වයට අදාළ පහත සඳහන් කරුණු සම්බන්ධීකරණය කිරීමට පියවර ගන්නා ලදි. 1994 වර්ෂයේදී සමායෝජක කණ්ඩායමේ රැස්වීම් හයක් පවත්වනු ලැබීය.

1.1.1 ජීව විවිධත්වය පිළිබඳ ජාතික විශේෂඥ කමිටුව පිහිටුවීම - කමිටුව පිහිටුවන ලදි.

1.1.2. ශ්‍රී ලංකාව සඳහා ජෛව විවිධත්ව ක්‍රියාත්මක සැලැස්මක් සැකසීම සඳහා උපාය මාර්ගය - උපාය මාර්ගය සකසන ලදි.

1.1.3. ඖෂධ පැළෑටි ප්‍රවර්තනීය ලෙස භාවිතය හා සංරක්ෂණය සඳහා අනුගමනය කළ යුතු කරුණු ඇතුළත් ලියවිල්ල සකස් කිරීම - ලියවිල්ල සකස් කරන ලදි.

1.1.4. ජෛව විවිධත්ව කටයුතු සඳහා විශේෂ ඒකකයක් පිහිටුවීම.

- ජෛව විවිධත්වය සඳහා පූර්ණ කාලීන උපදේශකවරයෙකු පත් කරනු ලැබ ඇත.
- උපාධිධාරි අභ්‍යාසලාභීන් තිදෙනෙකු අනුයුක්ත කරනු ලැබ සිටී.
- 1995 වර්ෂය සඳහා සවිස්තරාත්මක වැඩ සැලැස්ම සකස් කර ඇත.
- පහත දැක්වෙන ව්‍යාපෘති සඳහා අරමුදල් සපයා ගැනීමේ වැඩ පිළිවෙල සඳහා මූලික කටයුතු කර ඇත.
  - * ශ්‍රී ලංකාව සඳහා වන ජෛව විවිධත්ව ක්‍රියාත්මක සැලැස්ම.
  - * ඖෂධ පැළෑටි සංරක්ෂණය හා ප්‍රවර්තනීය භාවිතය.

* ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සඳහා අවශ්‍ය දක්ෂතා හා ආයතනික හැකියාව වැඩි දියුණු කිරීම.

1.1.5. ජීව විවිධත්වය පිළිබඳ සම්මුතියට එකඟත්වය පළ කිරීම.

* ජෛව විවිධත්ව ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකා විශේෂඥයන්ගේ අදහස් ඇතිව සම්මුතියට එකඟවන ලදි.

1.1.6. ජෛව විවිධත්වය සඳහා 'සොබා' සඟරාවේ විශේෂ කලාපයක් නිකුත් කිරීම.

- ජෛව විවිධත්වය පිළිබඳව ශ්‍රී ලංකා විද්වතුන් විසින් ලියන ලද ලිපි 19 ක් ඇතුළත්ව 1994 නොවැම්බර් මස දී වෙළුම 5/ අංක 3 දරණ ' සොබා' විශේෂ කලාපය සකස් කරන ලදි.

1.1.7. ජෛව විවිධත්වය පිළිබඳව අන්තර් ජාතික රැස්වීම්වල/සම්මන්ත්‍රණවල/ වැඩ මුළුවල වාර්තා සමාලෝචනය.

- සමායෝජක කණ්ඩායම විසින් පහත දැක්වෙන වාර්තා සමාලෝචනයට භාජනය කරන ලදි.

  * ජීව විවිධත්වය පිළිබඳව විද්‍යාත්මක විශේෂඥවරුන්ගේ පළමුවන විවෘත-සමාප්ති අන්තර් රාජ්‍ය රැස්වීම.
  * ජීව විවිධත්වය පිළිබඳ සම්මුතිය සඳහා වන අන්තර් රාජ්‍ය කමිටුවේ රැස්වීම.
  * ජීව විවිධත්වය පිළිබඳ ආසියානු සංවර්ධන බැංකුවේ වැඩමුළුව.

1.2 ජීව විවිධත්වය පිළිබඳ ජාතික විශේෂඥයන්ගේ කමිටුව මාර්ගයෙන්, පහත දැක්වෙන ජාතික ජෛව විවිධත්ව කරුණු ගැන උපදෙස් දීමට පියවර ගන්නා ලදි.

1994 වර්ෂය තුළදී විශේෂඥවරුන්ගේ කමිටුවේ රැස්වීම් දෙකක් පවත්වන ලදි.

1.2.1 ජීව විවිධත්වය පිළිබඳ සම්මුතියේ පාර්ශවකරුවන්ගේ සාකච්ඡාව සඳහා රටේ තත්ත්ව වාර්තාව සකස් කිරීම.

- සැකසීම සම්පූර්ණ කර ඇත.

1.2.2. මිරිදිය ජලාශ මත්ස්‍යයින් අපනයනය පිළිබඳ තත්ත්වය.

- ඉහත සඳහන් කාරණයට අදාළ තත්ත්ව වාර්තාව සැකසෙමින් පවතී.

## මොන්ට්‍රියල් සන්ධානය ක්‍රියාත්මක කිරීම

ඕසෝන් ස්ථරයට හානිකර ද්‍රව්‍යයන් භාවිතා කිරීම සම්බන්ධව කාලසටහනක් සැකසීම සඳහා රටේ අධ්‍යයන වාර්තාව අමාත්‍යාංශය විසින් සකස් කර, පෙබරවාරි මාසයේ දී එක්සත් ජාතීන්ගේ වැඩසටහන වෙත ඉදිරිපත් කරනු ලැබීය. මාර්තු මාසයේ දී මොන්ට්‍රියල් බහුපාක්ෂික අරමුදල විසින් මෙම වැඩසටහන අනුමත කරන ලදී. බහුපාක්ෂික අරමුදලෙන් ලැබුණු මූල්‍ය සහායද සමඟ මෙම අමාත්‍යාංශයේ මොන්ට්‍රියල් සන්ධානය සඳහා වෙනම ඒකකයක් පිහිටුවන ලදී. රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආනයන කරුවන්, පාරිභෝගිකයින් අතර කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ කර්මාන්ත අළුත් තාක්ෂණයන්ට පරිවර්තනය වීම සඳහා ආධාර කිරීමද මෙම ඒකකයේ කාර්යයන් වේ.

ක්‍රි.ව.2005 ජනවාරිවලින් ඔබ්බට ඕසෝන් ස්ථරයට හානිකර ද්‍රව්‍යයන් පාවිච්චි කිරීම තහනම් කරන නියෝගයක් ගරු අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලදී. ශීතකරණ නිපදවන කර්මාන්තශාලා තුනක ක්ලෝරෝ/ප්ලුරෝ කාබන් භාවිතය ඉවත් කිරීම සඳහා මුදල් ආධාර ඉල්ලන ව්‍යාපෘති යෝජනාවක් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් බහුපාක්ෂික අරමුදල වෙත ඉදිරිපත් කරන ලදී.

## දේශ විපර්යාස පිළිබඳ සම්මුතිය

දේශ විපර්යාසය නිසා, රටේ කෘෂිකර්මයට හා වෙරළබඩ ප්‍රදේශයට සිදුවන බලපෑම් සම්බන්ධව අධ්‍යයනයක් ආසියානු සංවර්ධන බැංකුවේ අනුග්‍රහයෙන් අමාත්‍යාංශය විසින් ආරම්භ කිරීමත්, මාර්ග ආයතනය විසින් ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කිරීමත් මෙම වර්ෂය තුළදී සිදු කරන ලදී. රටේ විද්‍යාත්මක පුස්තකාල 45 අතරේ මෙම අවසාන වාර්තාව බෙදා දෙන ලදී.

සම්මුතිය යටතේ අවශ්‍ය පරිදි අමාත්‍යාංශය හරිතාගාර ගෑස් ඉන්වෙන්ට්‍රියක් සැකසීම, දුම් පිටවීම සමනය කිරීම සඳහා විකල්ප මාර්ග සෙවීම සහ කාලගුණ විපර්යාසයේ අවදානම් තත්ත්වය තක්සේරු කිරීම යන ක්ෂේත්‍ර ආවරණය වනපරිදි අධ්‍යයනයක් ආරම්භ කර ඇත. මේ සඳහා අරමුදල් ඇමෙරිකා එක්සත් ජනපදයේ පාරිසරික ආරක්ෂණ ආයතනයෙන් ලැබී ඇත. මෙම අධ්‍යයනය විශ්ව විද්‍යාලවල විද්‍යාඥයින්ගෙන් ද ශ්‍රී ලංකා කාර්මික හා විද්‍යාත්මක පර්යේෂණ ආයතනය සහ මූලික අධ්‍යයන ආයතනය යන පර්යේෂණ ආයතන දෙකේ විද්‍යාඥයින්ගෙන් ද සමන්විත කණ්ඩායමක් මගින් සිදු කරන ලදී.

කාලගුණ විපර්යාසයේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වියහැකි මුහුදු මට්ටම ඉහළ යාම අධීක්‍ෂණය කිරීම සඳහා ඒකාබද්ධ වැඩපිළිවෙළක් ආරම්භ කිරීමට අමාත්‍යාංශය ඉන්දියානු බලධාරීන් සමග සාකච්ඡා පැවැත්වීම ආරම්භ කර ඇත. ඉන්දු-ශ්‍රී ලංකා විද්‍යා සහ තාක්‍ෂණික සහයෝගිතා වැඩසටහන යටතේ මෙම අධ්‍යයනය කිරීමට ගිවිසුමක් ඇති කරගන්නා ලදී.

## පවිත්‍ර වාතය - 2000 ක්‍රියාත්මක සැලැස්ම

මේ යටතේ ඩීසල් වාහනවලින් අධික දුම් පිටවීම පරීක්‍ෂා කිරීම සඳහා මේ වර්ෂය මුලදී දුම්මානක යන්ත්‍ර 65 ක් ලබාගෙන, පොලිස් ස්ථාන සහ මෝටර් රථ ආරක්‍ෂක වරුන්ගේ ප්‍රාදේශීය කාර්යාල අතර බෙදා හරින ලදී. දුම් පිටවීමට ඉඩ දියහැකි උපරිම මට්ටම් සඳහන් කරමින් අදාළ රෙගුලාසි ගැසට් පත්‍රයේ පළ කරන ලදී.

කොළඹ නගරය තුළ වායු තත්ත්වය පරීක්‍ෂා කිරීම සඳහා ස්ථිර ස්ථාන දෙකක් පිහිටුවීමටත්, ජංගම ස්ථානයක් පිහිටුවීමටත් කටයුතු කර ඇත. වායු තත්ත්ව ප්‍රමිතීන් නියම කෙරෙන රෙගුලාසි ගැසට් පත්‍රයේ පළ කරන ලදී. දුම් පිටකෙරෙන මූලාශ්‍ර පිළිබඳ ප්‍රමිතීන් සකස් කිරීමටත්, වායු තත්ත්ව පරීක්‍ෂා කිරීමේ ස්ථාන සඳහා දිවයින පුරා ජාලයක් සැලසුම් කිරීමටත් උපකමිටු රැස්වීම් කිහිපයක් පවත්වන ලදී.

දුම් පිටවීම පාලනය කිරීම අන්තර්ගත වන පරිදි වාහනවලට යෝග්‍යතා සහතික නිකුත් කිරීම ගැනත්, තම බල ප්‍රදේශවල ඩීසල් වාහන සම්බන්ධයෙන් ස්ථානගත පරීක්‍ෂණ පැවැත්වීම ගැනත් පළාත් සභා නියෝජිතයින් සමග සාකච්ඡා පවත්වන ලදී.

**නීති ඒකකය:**

මෙම අමාත්‍යාංශයේ නීති ඒකකය 1994 ජුනි මස පිහිටුවා නීති උපදේශක වරයෙක් එක් අවුරුදු කාලසීමාවකට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලදී. ඉන් පසුව එම ඒකකයට ව්‍යාපෘති සහායක වරයෙකු (නීතිඥ) කෙටි කාලීන අනියම් පදනමක් මත බඳවා ගන්නා ලදී. මෙම නීති ඒකකය නීති අධ්‍යාපන මණ්ඩලය සමඟ සාකච්ඡා කොට නීතිය පුහුණු වන්නෙක් 1994 දෙසැම්බර් මස සිට මෙහි වැඩට යොදවා ගැනීමට අවස්ථාව සලසා ගන්නා ලදී.

මෙම නීති ඒකකයේ කාර්යයන් :-

1. පරිසර නීතිය වෙනස් කිරීම සහ සලකා බැලීම
2. ජාතික පාරිසරික පනතේ රෙගුලාසි සහ මාර්ගෝපදේශ සැකසීම සහ ඒ පිළිබඳව ප්‍රතිරීක්ෂණය කිරීම.
3. මෙම අමාත්‍යාංශයට සහ ඒ හා සම්බන්ධ වෙනත් ආයතන වලට පාරිසරික නීති පිළිබඳ කරුණු සම්බන්ධව නීති උපදෙස් දීම, සහ නීතිපති දෙපාර්තමේන්තුව සමඟ එවැනි කරුණු සම්බන්ධව කටයුතු කිරීම.
4. ජාතික පාරිසරික පනත යටතේ ඇති අභියාචනා ක්‍රියාපටිපාටිය සම්බන්ධව මෙම අමාත්‍යාංශයේ ලේකම්ට උපදෙස් දීම.

පාරිසරික නීති පිළිබඳ ප්‍රතිරීක්ෂණය

1994 ජුනි මස සිට ශ්‍රී ලංකාවේ පාරිසරික නීතිය පිළිබඳව කරුණු විශාල වශයෙන් . ප්‍රතිරීක්ෂණය කිරීමත් බාරගන්නා ලදී. ඒ සඳහා එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහනේ මූල්‍ය සහ වෙනත් ආධාර ලබා දී ඇත. 1994 ජුනි මස හිටපු පාරිසරික හා පාර්ලිමේන්තු කටයුතු ඇමතිතුමා විසින් සාමාජිකයින් 9 දෙනෙකුගෙන් සමන්විත පාරිසරික කමිටුවක් පත්කරන ලදී. නව ප්‍රවාහන, පරිසර හා වනිතා කටයුතු ඇමතිතුමිය විසින් එම කමිටුව පිළිගෙන රාජ්‍ය නොවන ආයතන වල සාමාජිකයෙක්ද එයට පත්කර ඇත.

එම පාරිසරික කමිටුව විසින් මහජන සහභාගිත්වය ඇතිව ජාතික පාරිසරික පනත පිළිබඳව කරුණු විමසීමක් කරන ලදී. ඒ සඳහා රාජ්‍ය ආයතන/ රාජ්‍ය නොවන ආයතන සහ අධ්‍යාපන ආයතන වලින් සැදුම්ලත් උප කමිටුවල සහයෝගය ලබාගන්නා ලදී. අළුත් නීති කෙටුම්පතක්, කෙටුම්පත් වාර්තාවක් සමඟ මහජනයාගේ සහ නිලධාරීන්ගේ නිරීක්ෂණ සඳහා ඉදිරිපත් කරන ලදී. එය සාර්ථක ප්‍රයත්නයකි. එහිදී ඉදිරිපත් කරන ලද අදහස් පිළිබඳව අධ්‍යයනයක් කර ඒ පිළිබඳ වාර්තාව සහ නීති කෙටුම්පත කැබිනට් මණ්ඩලයට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා ගරු ඇමතිතුමිය වෙත ඉදිරිපත් කර ඇත.

මෙම නව නීති කෙටුම්පත තුලින් නීතිය ක්‍රියාත්මක කිරීම, පුරවැසියන්ගේ නෛතික කටයුතු, ධාර්මික සම්බන්ධතා සහ දිරිගැන්වීම් , පාරිසරික අයිතිවාසිකම් සහ යුතුකම්, පාරිසරික විශ්වය සහා, ක්ෂණික දඩ ගැසීම් සහ ආයතනික සංශෝධන ආදී කරුණු රැසක් පිළිබඳව අවධානය යොමු කරන ලදී. ලෝක බැංකුව මේ සඳහා ආධාර කරමින් මෙම ප්‍රයත්නය ලොව පුරා පිළිගත් නීතිය සම්බන්ධ වැදගත් ප්‍රයත්නයක් ලෙස පැසසුමට ලක්කරයි.

රෙගුලාසි

ජාතික පාරිසරික පනත 1980 ක්‍රියාත්මක කරන ලද අතර 1988 සංශෝධනය කරන ලදී. ඒ කාලසීමාව තුල එම පනත මගින් රෙගුලාසි කොටස් දෙකක් නිකුත් කර ඇත. එනම් පරිසර තක්සේරු ක්‍රියා පටිපාටිය (1993) සහ පාරිසරික දූෂණ පිළිබඳ බලපත්‍ර නිකුත් කිරීම(1990) සම්බන්ධවයි. මෙම අමාත්‍යාංශයේ නීති ඒකකය විසින් ජාතික පාරිසරික පනත යටතේ රෙගුලාසි රැසක් සැකසීම සඳහා පියවර ගෙන ඇත. එම පියවර ශ්‍රී ලංකාවේ පාරිසරික නීති රාමුව තුල හිස්තැන් පිරවීමක් වශයෙන් උපකාරවී ඇත.

නව ඇමතිතුමිය විසින් පහත රෙගුලාසි සකසා නිකුත්කර ඇත.

1. වසර 2000 ජනවාරි 01 සිට ඕසෝන් ස්ථරය විනාශ වීමට හේතුවන ද්‍රව්‍ය භාවිතය තහනම් කිරීම.
2. සංසරණ වායු තත්ත්වය සම්බන්ධ රෙගුලාසි
3. ජාතික පාරිසරික පනත යටතේ අභියාචන පටිපාටිය පිළිබඳ රෙගුලාසි

පහත සඳහන් රෙගුලාසි දැනට සැකසෙමින් පවතී.

1. ව්‍යාපාර අනුමත කිරීමේ ආයතන නැවත ගැසට් ගත කිරීම සහ පරිසර බලපෑම් තක්සේරු කිරීම සඳහා අතිරේක සංවේදී ප්‍රදේශ නම් කිරීම.
2. විස ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ රෙගුලාසි
3. ආරක්ෂිත ප්‍රදේශ හරහා ගුවන්යානා ගමනාගමනය පාලනය කිරීම පිළිබඳ රෙගුලාසි
4. වායු පිටකිරීමේ ප්‍රමිතීන් පිළිබඳ රෙගුලාසි
5. දර්ශනීය ප්‍රදේශ සම්බන්ධ රෙගුලාසි
6. ශබ්ද දූෂණය පාලනය කිරීමේ රෙගුලාසි
7. පරිසරය පිළිබඳ අධ්‍යයනය කිරීමේ රෙගුලාසි
8. ජාතික පාරිසරික පනත යටතේ ගෙවීම් කිරීම ප්‍රතිරක්ෂණය කිරීම
9. ඝන සහ ද්‍රව අපද්‍රව්‍ය ඉවත්කිරීමේ ප්‍රදේශ සම්බන්ධ රෙගුලාසි

## නීතිය ක්‍රියාත්මක කිරීම

අමාත්‍යාංශය විසින් පරිසර නීති මහජන සුභසිද්ධිය සඳහා ක්‍රියාත්මක කිරීම පිළිබඳව විශේෂ උත්සාහයක් දරා ඇත. මෙම අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් පරිසර නීති ක්‍රියාත්මක කිරීමේ කමිටු පිහිටුවා ඇති අතර එම කමිටු වල වගකීම වන්නේ පොලිසිය සහ පළාත් පාලන ආයතන මඟින් නීතිය ක්‍රියාත්මක කරවීමයි. පොලිස්පතිවරයා විසින් සෑම පොලිස් ස්ථානයක් වෙතම ජාතික පාරිසරික පනත යටතේ සිදුකර ඇති වැරදි පිළිබඳව සොයාබලා නෛතික ක්‍රියාමාර්ග ගන්නා ලෙස උපදෙස් නිකුත් කර ඇත. එසේම මහජන කරදර සම්බන්ධව ප්‍රමුඛත්වය දී කටයුතු කරන ලෙසද දන්වමින් තවත් චක්‍රලේඛයක් නිකුත් කරනු ලැබේ.

නීතිපතිගේ උපදෙස් පිට මධ්‍යම පරිසර අධිකාරිය විසින් පළාත් පාලන ආයතන වෙත පාරිසරික යුතුකම් ඉටුකිරීම සඳහා උපදෙස් නිකුත් කිරීම අරඹනු ඇත. මෙම ඉටුකිරීම් එම ආයතන විසින් පැහැරහැරියහොත් මධ්‍යම පරිසර අධිකාරිය විසින් නීතිමය පියවර ගනු ලැබේ.

## නොරාඩ් පාරිසරික වැඩ සටහන:

පසුබිම: 1989 අගෝස්තු 14 වැනි දින නෝර්වේ ආණ්ඩුව සහ ශ්‍රී ලංකා ආණ්ඩුව අතර ඇතිවූ සම්මුතියක් අනුව මෙම වැඩසටහන 1990 සිට ක්‍රියාත්මක වේ. මුල් ගිවිසුම අනුව මෙම ආධාර ක්‍රමය නෝර්වීජියානු ක්‍රෝනර් මිලියන 24 ක(ශ්‍රී ලංකා රුපියල් මිලියන 120 ක) වැඩසටහනකි. වාර්ෂික සමාලෝචන රැස්වීම් වල ගන්නා තීරණ පරිදි මෙම වැඩසටහන යටතේ වාර්ෂිකව මුදල් වෙන් කිරීම් කරනු ලැබේ.

මෙම නොරාඩ් ආධාර ක්‍රමය ක්‍රියාත්මක වන්නේ ප්‍රධාන විෂය ක්ෂේත්‍ර 7 ක් තුළය.

එනම්:
1. ආයතන වැඩදියුණුව හා පුහුණු කටයුතු.
2. පරිසර සංරක්ෂණය හා කළමනාකරණය.
3. පාරිසරික දූෂණය.
4. පාරිසරික අධ්‍යාපනය හා දැනුවත් කිරීම.
5. පාරිසරික පර්යේෂණ හා සැළසුම්.
6. යොබා සංරක්ෂණය.
7. අධ්‍යයනය හා සමාලෝචනය.

නොරාඩ් පාරිසරික වැඩසටහන ප්‍රවාහන, පරිසර හා මහිලා කටයුතු අමාත්‍යාංශයට සබැඳි වැදගත් වැඩසටහන් වේ.

සිංහරාජ හා දුම්බර ව්‍යාපෘති වැනි විශාල ව්‍යාපෘති සඳහා අමාත්‍යාංශය මුදල් ලබා දීමෙහි හා ප්‍රගති සමීක්ෂණය කිරීමේ ආයතනයක් වශයෙන් කටයුතු කරයි. මෙම අමාත්‍යාංශයෙන් ලබා දෙන ආධාර හා ඒ සඳහා කෙරෙන නිර්දේශ විශ්වවිද්‍යාල, ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය සහ රජයේ නොවන ආයතනවල ව්‍යාපෘති සඳහා විශේෂ රුකුලක් වේ.

මෙම අමාත්‍යාංශය හා මධ්‍යම පරිසර අධිකාරිය වැනි ආයතන වලට මෙම වැඩසටහන මගින් ලබාදෙන ආධාර ඒවායේ ආයතනික දියුණුව සඳහා විශේෂ වැදගත්කමක් දරයි. නොරාඩ් වැඩසටහනේ ආවේනික නම්‍යතාවය නිසා අමාත්‍යාංශයේ තීරණ අනුව කටයුතු කිරීමට අවස්ථාවද ලබාදෙයි.

### 1994 වැඩසටහන:

1993.12.12 දින පැවති වාර්ෂික සමාලෝචන රැස්වීමේදී ඉදිරියට ගෙන යන ව්‍යාපෘති 18 ක් සඳහා රුපියල් මිලියන 13.207 ක්ද, නව ව්‍යාපෘති 17 ක් සඳහා රුපියල් මිලියන 15.05 ක් ද වෙන් කරන ලදි. තවද, රුපියල් මිලියන

7.11 ක් වැය වන නව ව්‍යාපෘති 17 ක් ඉඩ ලැබෙන පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා වෙනම ලැයිස්තුවක් තබන ලදී. මේ අනුව, 1994 වැඩසටහන රුපියල් මිලියන 35 ක් සැලසුම් රාමුවක් තුල රුපියල් මිලියන 28.26 ක වැඩසටහන් විය. මීට අමතරව, නාවලපිටිය නගරයේ කසල ඉවත් කිරීම සඳහා රු.513,000/= ව්‍යාපෘතියක් 1994 අගෝස්තු මාසයේදී අනුමත කරන ලදී.

## 3. තෝරාගත් වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳව ඇතිවූ ආයතනික වෙනස්වීම්.

### 3: 1: වැඩසටහන අධීක්ෂණය කිරීමේ වැඩසටහන් ඒකකය:

පරිසර අධ්‍යාපනය සඳහා විශේෂ වැඩසටහන් නිලධාරියෙක් 1994 ජූලි මාසයේදී පත් කරන ලදී. මෙම නිලධාරී යා පරිසර ක්ෂේත්‍ර අධ්‍යයනය හා සම්බන්ධයෙන් 1970 දී මූලික වූවකි. මෙය පාරිසරික අධ්‍යාපන වැඩසටහනේ නව නැඹුරුව සඳහා අවශ්‍ය වූවක්.

මෙම වසර තුළදී වැඩසටහන සඳහා ඒකාබද්ධ අරමුදලෙන් පඩිලබන ලිපිකරුවෙක් හා කා.කා.ස.වරයෙක් ද පත් කරන ලදී. උපාධි අභ්‍යාස ලාභී වැඩසටහන යටතේ නිලධාරියෙකුගේ සහාය ද මෙම ඒකකයට 1994 දී ලැබුනි.

### 3: 2: කොට්ඨාශ මට්ටමේ වැඩසටහන

කොට්ඨාශ මට්ටමේ පාරිසරික ව්‍යාපෘති අධීක්ෂණය කිරීම 1990 වසරේදී අමාත්‍යාංශයට ඇතුලත් විය. මේ සඳහා පාර්ලිමේන්තු කටයුතු අංශයේ රාජ්‍ය ලේකම්ගේ යටතේ විශේෂ ඒකකයක් ඇති කරන ලදී. මෙම ඒකකය ඇති කිරීම සඳහා හා ඒ සඳහා මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් මාස කීපයක් ගතවුනු බැවින් මෙම ඒකකයේ වැඩ පටන් ගන්නා ලද්දේ ජූලි මාස-යේදීය.

### 3: 3: පාරිසරික කාර්යයන් සඳහා ප්‍රාදේශීය පරිපාලනය ශක්තිමත් කිරීම.

මේ සඳහා වූ ව්‍යාපෘතිය 1994 දී පැවති මහා මැතිවරණය හා ජනාධිපතිවරණ ඡන්ද විමසීම නිසා බොහෝ දුරට සීමා කිරීමට සිදුවිය. මෙම වැඩසටහනට ඇතුලත් පළාත්, දිස්ත්‍රික්ක හා කොට්ඨාශ මට්ටමේ නිලධාරීන් පුහුණු කිරීම සඳහා පැවැත්විය යුතු වැඩමුළු කල්දැමීමට සිදුවිය. එහෙත් මෙම නිලධාරීන්ගේ පුහුණු කටයුතු සඳහා අවශ්‍ය වන අත්පොත් ආදිය පිළියෙල කර බෙදා හැරීම සඳහා කටයුතු කරන ලදී. මෙම ඒකකය මගින් මහමෙවුනා උයන් වැඩිදියුණු කිරීම හා ආදර්ශ ගම් ව්‍යාපෘතියක් ද ක්‍රියාත්මක කරන ලදී.

1994 අගෝස්තු මස පාර්ලිමේන්තු මහ මැතිවරණයෙන් පසු පාරිසරික අංශය අලුතින් ඇති කරන ලද ප්‍රවාහන, මහාමාර්ග, පාරිසරික හා වනිතා කටයුතු අමාත්‍යාංශයට ඇතුලත් විය. කලින් තිබූ අමාත්‍යාංශයේ ලේකම් හා ව්‍යාපෘති රාජ්‍ය ලේකම් වරු මෙම අමාත්‍යාංශය තුල සිටීම නිසා ඒ අයගේ

ලැබුනු අනුග්‍රහය දිගටම ලැබීමට හැකිවිය.

ජනාධිපතිවරණයෙන් පසු මෙම අංශය සංශෝධනය වූ ප්‍රවාහන, පරිසර හා වනිතා කටයුතු අමාත්‍යාංශයට ඇතුලත් විය.

## 3: 4: සොබා සඟරාව:

මෙම වසර අවසාන කොටසේදී සොබා සඟරාවේ වැඩ කටයුතු තවත් දියුණු කිරීම සඳහා පියවර ගන්නා ලදී. ඒ අනුව, නැවත පිහිටුවන ලද සංස්කාරක මණ්ඩලයට විශ්‍රාම ලත් මහාචාර්ය වී.බස්නායක මහතාගේ හා තවත් අර්ධකාලීන සංස්කාරක ගේ සේවය ලබා ගන්නා ලදී.

## 4. වර්ෂය තුල සිදුවූ වැදගත් කරුණු:

ඒවා අතර විශේෂ සිදුවීම් පහතින් දක්වා ඇත.

## 4: 1: නගරාසන්න සොබා රක්ෂණ ජාල ව්‍යාපෘති:

මේ සඳහා මූලික පියවර අමාත්‍යාංශය විසින් 1994 මාර්තු මාසයේදී ගන්නා ලදි. මෙවැනි ජාලයන් ඇතිකිරීම සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලබාගත් අතර එම වැඩසටහනේ අරමුණු වන්නේ;

(අ) නගරාසන්නයේ ඇති සොබා රක්ෂිත හඳුනා ගෙන ඒවා වැඩිදියුණු කිරීම.

(ආ) ඒවා තුල ඇති ශාඛ, සත්ව කොටස් සංරක්ෂණය කිරීම.

(ඇ) නාගරික ජනගහනයේ පාරිසරික දැනුම දියුණු කිරීම හා විශේෂයෙන්ම පාසල් ශිෂ්‍යයන්ගේ පාරිසරික දැනුම සඳහා මෙම රක්ෂිත හා සම්බන්ධ සම්පත් ( වීථිමත් ලෙස වැඩිදියුණු කිරීම.

(ඈ) වෙනත් ආකාරයකින් අවස්ථාව නොලබන නගරවාසීන් වැඩි කොටසකගේ ආශ්වාදය සඳහා මෙම රක්ෂිත යොදා ගැනීම.

කැබිනට් අනුමැතිය ඇතිව පත්කරන ලද කමිටුව 1994 මැයි මාසයේ සිට මාසිකව රැස්වී ඇත. එහි අනුකමිටුව නිතර නිතර රැස්වී කමිටුවට යෝජනා ඉදිරිපත් කරන ලදී.

අදාළ ස්ථාන කිපයකට ගොස් නිරීක්ෂණය කළ කමිටුව තෝරාගත් රක්ෂිත අතර, ජයවර්ධන පුර පාර්ලිමේන්තුව අවට රක්ෂිතය , බෙල්ලන්විල - අත්තිඩිය රක්ෂිතය ,ගම්පහ පිළිකුත්තුව හා ගාල්ල රුමස්සල රක්ෂිතය වේ. මේවා දැනටමත් තෝරා ගෙන නොරාඩ් වැඩසටහන යටතේ පාරිසරික අධ්‍යාපනය සඳහා භාවිතා වන මහනුවර උඩවත්ත කැලේ, රත්නපුර ඉපාම්පා කැලේ, කෑගල්ල කුරුළු කැලේ හා කුරුණෑගල ඇතුගල් රක්ෂිතයට අමතරවේ. ජයවර්ධන පුර රක්ෂිතය පිළිබඳ සැලසුමක් සෑදීම සඳහා උපදේශකත්වයක් ප්‍රධානය කර ඇත. මෙම රක්ෂිත ජාලයේ අධ්‍යාපන කොටස සඳහා රුපියල් මිලියන 1.6 ක ප්‍රතිපාදනයක් නොරාඩ් ව්‍යාපෘතිය යටතේ ලබා ගෙන ඇත.

පාරිසරික සංරක්ෂණය හා ඵලදායක පාරිසරික අධ්‍යාපන ක්‍රමයක් ඇති කිරීම සඳහා මෙම අමාත්‍යාංශය මගින් මූලික වූ විශේෂ ව්‍යායාමයක් හැටියට මෙම වැඩසටහන හඳුන්වා දිය හැකිය.

4: 2: <u>වැඩසටහන ප්‍රතිපූරණ පදනමක් යටතේ ක්‍රියාත්මක කිරීම.</u>

1993 දක්වා අත්තිකාරම් ක්‍රමයක් යටතේ පැවති මෙම ආධාර ක්‍රමය සම්පූර්ණයෙන්ම ප්‍රතිපූරණ පදනමක් යටතේ කටයුතු කිරීම 1994 දී ක්‍රියාත්මක කරන ලදී.

4: 3: <u>සිංහරාජ හා දුම්බර සැලැස්මේ දෙවැනි අදියර අනුමත කිරීම:</u>

වර්ෂ කිපයකම දෙවැනි අදියර අනුමත කිරීම පමාවෙමින් තිබුන මුත් 1994 ජූලි මාසයේදී රුපියල් මිලියන 44.7 ක් වන තුන් අවුරුදු දෙවැනි අදියර සැලැස්ම අනුමත කර ගැනීමට හැකිවිය. දුම්බර රක්ෂිතයේ සංරක්ෂණ කටයුතු සඳහා බාධාවක්ව පැවතුන එහි පදිංචිව සිටින පවුල් 42 වෙනත් ස්ථානයකට ගෙනයාම සඳහා අධ්‍යයනයක් මෙම වසර තුලදී පටන් ගන්නා ලදී.

1994 තුලදී මෙම වැඩසටහනේ සීඝ්‍ර දියුණුවක් ඇතිවූ අතර, ඒ අනුව රුපියල් මිලියන 5.4 ක වැය කිරීමක් ද ඇතිවී ඇත.

4: 4: <u>කඩොලාන සංරක්ෂණ ව්‍යාපෘතිය:</u>

මෙම වසර තුලදී කඩොලාන සංරක්ෂණ ව්‍යාපෘතිය නැවත ප්‍රතිසංවිධානය කිරීමට හැකිවිය. කඩොලාන ප්‍රදේශ සිතියම් ගතකිරීම, කඩොලාන සම්බන්ධ නීතිමය ප්‍රශ්න හා සම්බන්ධයෙන් අධ්‍යයන උපදේශකත්ව ද මෙම වසර තුලදී ප්‍රදානය කරන ලදී. කඩොලාන ව්‍යාපෘතිය ද මෙම වසර තුළදී දියුණුවක් පෙන්වන ලද අතර, ඒ සඳහා වූ වැයකිරීම රුපියල් මිලියන 3.2 කි.

4: 5: <u>වැඩසටහනේ අධ්‍යාපන කොටස් අගැයීම:</u>

මෙම කොටස අගැයීම් කර වාර්තාවක් නිකුත් කිරීම සඳහා අධ්‍යයන උපදේශකත්වයක් ශ්‍රී ලංකා අධ්‍යාපනාභිවර්ධන සංගමයට ප්‍රදානය කරන ලදී. මෙම වාර්තාව 1994 දෙසැම්බර් මස ඉදිරිපත් වූ අතර එහි නිර්දේශ අනුව 1995 සඳහා වන අදාළ වැඩ සටහන් සංශෝධනය කරන ලදී.

4: 6: <u>'රන්දිය' ප්‍රථම පාරිසරික ගීතිකාව නැවත රඟදැක්වීම.</u>

'රන්දිය' ප්‍රථම පාරිසරික ගීතිකාව 1993 දී තොරාගත් ව්‍යාපෘතියක් වශයෙන් ප්‍රේමකුමාර එපිටවල මහතා විසින් නිෂ්පාදනය කර රඟදක්වන ලදී. මෙහි රඟනයට සහභාගී වූයේ මහනුවර පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ය. 1994 නොවැම්බර් මාසයේ මෙම ගීතිකාව නැවත සම්භාවනීය පිරිසක් ඉදිරියේ රඟදැක්විය.

5. **මූල්‍යමය ප්‍රගතිය:**

1994 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් කාලය තුළදී කරන ලද වියදම රුපියල් 20,746,000/= ක් වූ අතර, ඒ සඳහා ලබාදෙන ලද ප්‍රතිපාදන රු.28,848,000/= ක් විය.

6. **වැඩසටහනේ සංශෝධිත උපාය මාර්ග:**

ප්‍රධාන අරමුණ. ස්වාභාවික සම්පත් සඳහා මනා කළමනාකරණය වනඅතර, එහි අංග වශයෙන් හඳුනාගෙන ඇත්තේ,

(අ) පාරිසරික කරුණු සම්බන්ධයෙන් අධ්‍යාපනය හා මහජන දැනුම වැඩිදියුණු කිරීම,

(ආ) සැලසුම් කිරීම හා කළමනාකරණය පිළිබඳව හැකියාවන් වැඩිදියුණු කිරීම,

(ඇ) පාරිසරික පද්ධති සංරක්ෂණය,

(ඈ) ප්‍රධාන අරමුණ හා අනිත් වැදගත් අරමුණු සපුරාලීම සඳහා පරීක්ෂණ කටයුතු මගින් අනුග්‍රහය,

මෙම උපාය මාර්ගයේ වැදගත් අංගයක් වනුයේ ජාතික පාරිසරික ක්‍රියාත්මක වැඩසටහන හා සමීප සම්බන්ධතාවයක් ඇති කිරීමය.

(අ) **පාරිසරික කරුණු සම්බන්ධයෙන් මහජන දැනීම වැඩිදියුණු කිරීම.**

මෙම අරමුණ යටතේ පරිසර වැඩසටහන තුළ ව්‍යාපෘති සංඛ්‍යාවක් තිබුන නමුත්, ඒවා වඩා ඵලදායි අරමුණක් කෙරෙහි යොමු කිරීම සුදුසු යයි හැඟී ඇත. 1994 දී පටන් ගත් නගරායත්ත සොබා රක්ෂිත ජලය තුළ අධ්‍යාපන කටයුතු පාරිසරික ක්ෂේත්‍ර අධ්‍යාපන කටයුතු හා ව්‍යාපෘති ක්‍රමය යොදා ගන්නා අධ්‍යාපන කටයුතු මෙම නව අරමුණ සඳහා නැඹුරුව විදහා දක්වයි.

(ආ) **සැලසුම් කිරීම හා කළමනාකරණය පිළිබඳ හැකියාවන් වැඩිදියුණු කිරීම.**

අමාත්‍යාංශයට, පරිසර අධිකාරියට හා කොට්ඨාශ මට්ටමේ පැවැත්වෙන පරිසර ව්‍යාපෘති වලට අනුග්‍රහය දැක්වීම මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා ඉවහල් වන ක්‍රියාකාරීත් වේ.

(ඇ) **පාරිසරික පද්ධති සංරක්ෂණය:**

ඉහතින් දක්වන ලද යෝජිත නගරායත්ත සොබා රක්ෂිත ජලය හා එය පරිසර අධ්‍යාපනය සඳහා යොදා ගැනීම නව නැඹුරුවේ විශේෂ අංගයකි.

(ඈ) පර්යේෂණ කටයුතු:

නව අරමුණු අනුව පාරිසරික ගැටළු විසඳීම සඳහා ඉතා ඉක්මනින් යොදා ගත හැකි ආයත ක්‍රම භාවිතය සඳහා වැඩි සැලකිල්ලක් දැක්වීම එම අරමුණට අදාල වේ.

(ඉ) ජාතික පාරිසරික ක්‍රියාත්මක වැඩසටහන:

මෙම වැඩසටහන භාවිතය සඳහා තැවන සළකා බැලීමේදී එක් විශේෂ ඌණතාවයක් වශයෙන් පෙනෙන්නේ පාරිසරික අධ්‍යාපනය සඳහා සොබා සම්පත් යොදා ගැනීමට අවකාශ නොලැබීම ය. තවත් ඌණතාවයක් වශයෙන් ඉදිරිපත් වූයේ පාරිසරික අධ්‍යාපනය සඳහා ගැලපෙන අගැයීම් ක්‍රම අඩුවීමය. මෙම ඌණතා මඟහරවා ගැනීම සඳහා ක්ෂේත්‍ර අධ්‍යයන ව්‍යාපෘති සහ නව අගැයීම් ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යයනයවෙනුවෙන් වැඩි අනුග්‍රහය දැක්වීමට වැඩසටහන් ඇති කරන ලදී.

වාර්ෂික සමාලෝචනය:

1994 වැඩසටහන් සමාලෝචනය හා 1995 වැඩසටහන් අනුමැතිය සඳහා වාර්ෂික සමාලෝචන රැස්වීම පැවැත්වූයේ 94.12.12. දින දීය. රුපියල් මිලියන 35 ක සැලසුම් රාමුවක් යටතේ රුපියල් මිලියන 30 ක ප්‍රතිපාදනයක් සහිතව 1995 වර්ෂය වෙනුවෙන් වාර්ෂික වැඩසටහන මෙහිදී අනුමත විය. මෙම වැඩසටහන අනුව ඉදිරියට ගෙන යන ව්‍යාපෘති 31 ක් හා නව ව්‍යාපෘති 22 ක් සඳහා ආධාර ලැබෙනු ඇත.

අයවැය විවාදයේදී ඉදිරිපත් විය හැකි ප්‍රශ්න පිළිබඳව:

1. තොරාඩ් පරිසර වැඩසටහන:

සමහර ව්‍යාපෘති වලට මුදල් වෙන් නොකිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් වියහැකි ප්‍රශ්න වෙනුවෙන්:

තොරාඩ් පරිසර වැඩසටහන ක්‍රියාත්මක වන්නේ වාර්ෂික සමාලෝචන රැස්වීම් වලදී අනුමත වන මුදල් ප්‍රතිපාදන හා අනුමත වන ව්‍යාපෘති අනුවයි. 1995 වැඩසටහන අනුමත කිරීම සඳහා සමාලෝචන රැස්වීම පැවැත්වුයේ 1994 දෙසැම්බර් 12 වැනි දිනදිය. 1995 සඳහා මුලු අනුමත මුදල් ප්‍රතිපාදනය රුපියල් මිලියන 30 කි. මෙම මුදලින් කොටසක් 1995 සඳහා ඉදිරියට ගෙනා ව්‍යාපෘති වෙනුවෙන් ද, අවශ්‍ය වේ. 1994 සඳහා විස්තරාත්මක සමාලෝචනයක් හා නව ව්‍යාපෘති යෝජනා ඇතුලත් වාර්තාවක් 1994 නොවැම්බර් මාසයේදී තොරාඩ් සංවිධානය වෙත යවන ලදී. මෙය ඔස්ලෝහි තොරාඩ් මූලස්ථානය වෙත යවන ලද අතර, වාර්ෂික සමාලෝචන රැස්වීමට කලින් ලබා දියහැකි මුදල් ප්‍රතිපාදන අනුව ඇතුලත් කළහැකි ව්‍යාපෘති පිළිබඳව සාකච්ඡා කිපයක් පවත්වන ලදී. 1995 වැඩ සටහන අනුමත කරන ගිවිසුම් පත්‍රය 1995.02.14 දින ලැබුනි.

ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වලින් අනුමැතිය සඳහා තෝරා ගැනීමේදී ලබා දියහැකි මුලු ප්‍රතිපාදනය හා තොරාඩ් වැඩ සටහනේ අරමුණු සළකා බලන ලදී. පරිසර අධ්‍යාපනය හා දැනුවත් කිරීමේ ව්‍යාපෘති අනුමත කිරීමේදී ඒ සඳහා පත් කරන ලද විශේෂ කොමිටියේ නිර්දේශ ද සළකා බලන ලදී.

1995 වැඩසටහන සඳහා රුපියල් මිලියන 35 ක සැලසුම් රාමුවක් තුල රුපියල් මිලියන 30 ක ප්‍රතිපාදනයක් සඳහා සැලසුම් වුවකි. මෙම වැඩසටහනට ඉදිරියට ගෙනෙන ලද ව්‍යාපෘති 31 ක් හා නව ව්‍යාපෘති 22 ක් ඇතුලත් වේ. කොට්ඨාශ මට්ටමේ සුලු ව්‍යාපෘති සඳහා මෙම සැලසුමේ ප්‍රතිපාදනයක් ද ඇත. මෙම කුඩා ව්‍යාපෘති තෝරා ගැනීමේදී බලපාන නිර්නායක වනුයේ ව්‍යාපෘති තුල කොට්ඨාශ මට්ටමේ පාරිසරික ගැටළුවක් විසඳීමට හැකියාව තිබීම හා ඒ සඳහා ක්‍රියාත්මක කරන්නන්ට හා අදාල මහජනයාට සහභාගී වීමට ඇති අවකාශය ය.

එමනිසා ඉදිකිරීම්, යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීම් හා පඩිනඩි වැඩි කොටසක් ඇති ව්‍යාපෘති අනුමත වන්නේ නැත.

වන ගොමු වැනි පාරිසරික සම්පත් කෙලින්ම පාරිසරික අධ්‍යාපනය සඳහා යොදා ගැනීමේ පරිසර ක්ෂේත්‍ර අධ්‍යයන වැඩසටහන තෝරාබේ වැඩ සටහනේ විශේෂ නව අංගයකි. මේ සඳහා පරිසර ක්ෂේත්‍ර අධ්‍යයන මධ්‍යස්ථාන ජාලයක් ඇති කිරීමේ විශේෂ වැඩසටහනක් ඇත. රත්නපුර, පොම්පකැලේ, හා මඩනුවර උඩවත්ත තැලේ ක්ෂේත්‍ර අධ්‍යයන මධ්‍යස්ථාන මේවා අතරේ දැනටමත් භාවිතය වන මධ්‍යස්ථාන වේ. පාසල් ව්‍යාපෘති මගින් ශිෂ්‍යයනට අත්දැකීම් ලබාගත හැකි පාරිසරික අධ්‍යාපනයක් ලබා ගැනීමට හැකි වන සේ පාසල් වැඩසටහන සම්පූර්ණයෙන්ම වෙනස් කර ඇත. මේ අනුව, කලින් වඩා අවධාරණය වූ හුදෙක් සමුච ආකාරයෙන් කරන පරිසර අධ්‍යාපනය සඳහා සැලකිල්ල අඩුකර ඇත.

## 2. <u>ගාල්ල රූමස්සල වන රක්ෂිතය:</u>

මෙය ප්‍රවාහන,පරිසර හා වනිතා කටයුතු අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කරන ලද නගරාසන්න ස්වාභාවික රක්ෂිත වැඩ සටහනට අයත් වූ ස්ථානයකි. රූමස්සල ස්වාභාවික පරිසරය දැනටමත් හානි වූ තත්ත්වයට පත්වී ඇති බැවින් එය රැකීම සඳහා වහාම කටයුතු කළයුතුව ඇත.

මෙම අමාත්‍යාංශයේ ඉල්ලීම අනුව රූමස්සල තුල තවදුරටත් ඉඩම් වෙන්කර දීම ආදිය නොකරන ලෙසට ඉඩම් අමාත්‍යාංශය මගින් හබරාදූව ප්‍රාදේශීය ලේකම් වෙත දැන්වීමක් කර ඇත. මෙම රක්ෂිතය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පවරා දෙන ලෙස එම දෙපාර්තමේන්තුව ප්‍රාදේශීය ලේකම් ගෙන් ඉල්ලීමක් කර ඇත. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය තව දුරටත් ක්‍රියා කරන අතර දැනට ඇති ප්‍රධාන පාරිසරික තර්ජනය නම් රක්ෂිතය තුල ඇති අනවසර පදිංචි වීම් 26 ක් හා එහි ගල්කැඩීමය. රූමස්සලට තවදුරටත් හානි වීමේ තර්ජනය වැළැක්වීම සඳහා එහි වැඩ ගැන අඛණ්ඩව සොයා බැලීම සඳහා කමිටුවක් අතිරේක ලේකම්(පාරිසරික) ගේ මූලිකත්වයෙන් 95.01.31 දින ගාල්ලේ පැවැත්වූ රැස්වීමේදී තීරණය කරන ලදී. මෙම කමිටුවේ ප්‍රධානත්වය උසුලන්නේ ගාල්ලේ දිසා ලේකම් ය. රූමස්සල රක්ෂිතයක් ඇති කිරීම සඳහා වෙන් කළහැකි කොටස පිළිබඳ අධ්‍යයනයක් කිරීම සඳහා තෝරාබේ ආධාර ක්‍රමය යටතේ මුදල් ද මෙම අමාත්‍යාංශය මගින් ලබා දී ඇත. දැනට සම්පූර්ණ මිනුම් කටයුතු කර රක්ෂිතය සඳහා වෙන් කළහැකි ඉඩම වන සංරක්ෂන දෙපාර්තමේන්තුවට ලබා දීමට කටයුතු

කරන අතර, පදිංචිය සඳහා යොදා නොගත් කොටස් වෙන් කිරීම සඳහා මායිම් කණු නොපමාව ඉද්කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගෙන ඇත. ඉහත රැස්වීමේදී ගල්කැඩීම සඳහා විකල්ප ස්ථාන සොයා බලා වාර්තා කිරීම එහි පැමිණි භූගත සම්පත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් භාර ගන්නා ලදී.

## ස්වාභාවික සම්පත් හා පාරිසරික ප්‍රතිපත්ති ව්‍යාපෘතිය:

01. <u>ව්‍යාපෘති නාමය:-</u> ස්වාභාවික සම්පත් හා පාරිසරික ප්‍රතිපත්ති ව්‍යාපෘතිය.

02. <u>ක්‍රියාත්මක කිරීමේ නියෝජිත:-</u> ප්‍රවාහන, පාරිසරික හා වනිතා කටයුතු අමාත්‍යාංශය.

03. <u>ව්‍යාපෘති විස්තරය:-</u> මෙම ව්‍යාපෘතිය පහත සඳහන් අරමුණු අත්පත් - කර ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණ සහාය සහ පුහුණු කිරීම් ලබාදේ.

(අ) පාරිසරික ප්‍රතිපත්ති, වැඩ සටහන් සහ ව්‍යාපෘති තීරණ සඳහා පාරිසරික ආර්ථික විද්‍යාව ගොඩනැඟීම.

(ආ) පොදු හා පෞද්ගලික තීරණ ගැනීම සඳහා පාරිසරික වත්කම් ගොඩනැඟීම.

(ඇ) ශ්‍රී ලංකාවේ අනාගත ආර්ථික වර්ධනය සඳහා පරිසර දූෂණය වැළැක්වීම හා අඩුකිරීම.

(ඈ) ශ්‍රී ලංකාවේ පාරිසරික සංවිධානයේ ආයතනවල හැකියාවන් දිරිමත් කිරීම.

(ඉ) පාරිසරික අධ්‍යාපනය හා පුහුණුව සඳහා ස්ථිර වැඩ සටහනක් ඇතිකිරීම.

<u>ඇස්තමේන්තු කළ මුළු වටිනාකම:-</u> විදේශාධාර - ඇ.ඩො.19,000,000 රු.800,000,00
ඒ.අ. - ඇ.ඩො. 7,135,000 රු.303,400,00

<u>අය වැය ඇස්තමේන්තුව:-</u>

| | | | | |
|---|---|---|---|---|
| 1992 | වි.රා.ආධාර | 97,000,000 | 58,473,212 | |
| | ඒ.අ. | 40,000,000 | 11,673,162 | 29.1% |
| | | 137,000,000 | | |
| 1993 | වි.රා.ආධාර | 85,000,000 | 185,238,173 | |
| | ඒ.අ. | 12,000,000 | 11,122,619 | 97.4% |
| | | 97,000,000 | | |
| 1994 | වි.රා.ආධාර | 50,000,000 | 135,554,032 | |
| | ඒ.අ.තරෙප් | 12,000,000 | 11,122,619 | 92.6% |
| | | 62,000,000 | | |
| | පා.බ.ඇ. | 10,000,000 | 5,610,827 | 56.1% |

## එකාබද්ධ අරමුදල් භාවිතය.

(රුපියල් දශලක්ෂ වලින්)

| | 1992 | 1993 | 1994 | එකතුව |
|---|---|---|---|---|
| 01. ව්‍යාපෘති පරිපාලනය | 0.30 | 1.10 | 1.38 | 2.78 |
| 02. පුහුණු කිරීම් | 0.32 | 1.56 | 3.39 | 5.27 |
| 03. උපකරණ - රේගු බදු | 9.10 | 5.81 | 6.06 | 20.97 |
| 04. පහසුකම් ආධාර | 1.96 | 3.20 | 5.84 | 11.00 |
| 05. පර්යේෂණ ආධාර | - | - | 0.055 | 0.055 |
| 06. අනියම් වියදම් | .002 | .002 | - | .004 |
| එකතුව | 11.682 | 11.672 | 16.725 | 40.079 |
| ප්‍රතිපත්ති අනුමත කිරීමේ ආයතන - පාර්ශ්ව ආධාර | 1.02 | 1.985 | 1.16 | 4.615 |
| මුළු එකතුව:- | 12.702 | 13.657 | 18.335 | 44.694 |